මහනුවර ඇසළ පෙරහැර භාරය
---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මතය ව්‍යාවනය
-------------------

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයිමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
-----------------------------------------

1.2.1 ගිණුම් පිළියෙල කිරීමේ අඩුපාඩු
-----------------------------------

1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනතේ 3(1) වගන්තිය යටතේ ඇසළ පෙරහැර භාරයේ පරිපාලන කටයුතු භාරවී ඇති මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් අවසන් ගිණුම සහතික කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සහතික කර තිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2010 වර්ෂයේ නිකුත් කරන ලද එහෙත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් 08ක වටිනාකම වූ රු.19,725ක් ගිණුම්වලින් ඉවත් කිරීම පිණිස සමුච්චිත අරමුදල් ගිණුම බැර කරනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමට බැර කර තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්නුම් කෙරේ.

(ආ) ශේෂ පත්‍රයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු රු.25,250ක උපකරණ, ඇසළ පෙරහැර භාරය සතුව නොතිබියදී, සාවද්‍ය ලෙස රු.1,262ක ක්ෂයවීම් ආදායම් වියදම් ගිණුමට හර කර තිබුණි.

(ඇ) පසුගිය වර්ෂ සඳහා ලැබිය යුතු ලෙසට ශේෂ පත්‍රයේ දක්වා තිබුණු රු.17,660,373ක් සහ ගෙවිය යුතු ලෙසට දක්වා තිබුණු රු.3,566,200ක් පිළිබඳව නිසි සොයා බැලීමකින් හා විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලට ගලපා ගණුම්වලින් ඉවත් කර තිබුණි.

1.2.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

(අ) මුල්‍ය ප්‍රකාශවල ඇතුළත් පහත සඳහන් ගිණුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ස්ථාවර වත්කම් | 98,600 | (i) අයිතිය හෝ හිමිකම පරීක්ෂා කිරීමට අදාළ ලිපි ලේඛන<br>(ii) ස්ථාවර වත්කම් ලේඛනය |
| නිර්වින්දන කාර්ය මණ්ඩලය සඳහා දීමනා | 78,000 | කාර්ය මණ්ඩල පැමිණීමේ ලේඛනය |

(ආ) ශේෂ පත්‍රයේ ජංගම නොවන වත්කම් යටතේ උපකරණ ලෙස රු.25,250ක වටිනාකමක් දක්වා ඇතත්, එකී උපකරණ භෞතික පරීක්ෂණය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

1.2.4 නොසැසඳුනු පාලන ගිණුම්

ආදායම් වියදම් ගිණුමේ රු.21,757ක් විවිධ වියදම් වශයෙන් දක්වා ඇතත්, එකී උපලේඛන අනුව එහි වටිනාකම රු.52,757ක් වූයෙන් රු.31,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 1.2.5 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ.225(4) | වවුචර් පිළියෙල කරන හෝ ඒවායේ හරි වැරදි බලන හෝ නිලධාරීන් අදාළ වවුචර්වල අත්සන යොදා අදාළ කාර්ය කළ බවට සනාථ කළයුතු වුවත්, අවස්ථා 20 කට අදාළ රු.214,569 ක් වූ ගෙවීම් සඳහා එම කාර්ය ඉටු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 237(ආ) | ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේ දී භාණ්ඩ ලැබී ඇති බවට අදාළ බඩු ලේඛනය, තොග පොත යනාදියෙහි ඇතුළත් කර ඇති බවට සහතික ඇමිණිය යුතු වුවත්, තොග සහතික නොමැතිව රු. 18,441 ක මිලදී ගැනීම් සඳහා ගෙවීම් කර තිබුණි. |
| (iii) මු.රෙ. 395 (ඇ) | එක් එක් මාසයට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශ ඊළඟ මස 15 දින හෝ ඊට පෙර පිළියෙල කළයුතු වුවත්, 2011 දෙසැම්බර් සිට 2012 මාර්තු දක්වා කාලයට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශ විගණන අවස්ථාව වූ 2012 අප්‍රේල් 10 දින දක්වාත් පිළියෙල කර නොතිබුණි. |
| (iv) මු.රෙ. 756 | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ සිදුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2006 වර්ෂයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 වගන්තිය | සෑම මිලදී ගැනීමක් සඳහාම තරඟකාරී මිල කැඳවීමක් සිදු කළයුතු වුවද, රු. 14,500ක් වැයකර ජායාරූප 3ක් මිලදී ගැනීමේ දී එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. |
| (ඇ) | 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනතේ 16(1) වගන්තිය | වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් නිසි පරිදි ගිණුම් පොත්පත් පවත්වාගෙන යා යුතු වුවද, භාරය සතු රු.98,600ක් වටිනා ස්ථාවර වත්කම් සටහන් කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර, එදිනෙදා මිලදී ගනු ලබන පරිභෝජන ද්‍රව්‍ය සටහන් කිරීම සඳහා තොග ලේඛන හා පරිභෝජන ද්‍රව්‍ය ලේඛන පවත්වාගෙන ගොස් තිබුණද, එම ලේඛන විධිමත්ව නඩත්තු කර නොතිබුණි. |

2. මූල්‍ය හා මෙහයුම් සමාලෝචනය
-----------------------------------

මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ අතිරික්තය රු.1,285,005ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ වූ අතිරික්තය රු.511,062 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.773,943 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ. සමාලෝචිත වර්ෂයේ ඇසළ පෙරහැර නැරඹීම සඳහා ආසන වෙන් කිරීම වෙනුවෙන් ලද ආදායම රු.2,112,800කින් වැඩිවීම එකී වර්ධනයට හේතුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 හඳුනාගන්නා ලද පාඩු
------------------------

ඇසළ පෙරහැර භාරය සතු රු.20,000,000 ක අරමුදල් 2002 වර්ෂය තුළ ප්‍රමුඛ බැංකුවේ තැන්පත් කිරීම හේතුවෙන් එකී මුදල් භාරය වෙත අහිමි වී තිබුණු අතර, අදාළ මුදල සහ ඊට අදාළව භාරය වෙත හිමිවිය යුතු පොලිය ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

අයවැය ලේඛනමය පාලනය

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත වියදම් තත්‍ය වියදම් සමඟ සැසඳීමේ දී වැය විෂයයන් 6ක 12% සිට 100% දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරණයක් ලෙස යොදා ගෙන නොමැති බව අනාවරණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ දරන ලද වියදම් විශ්ලේෂණය කිරීමේ දී වැය විෂයයන් 6ක 17% සිට 254% දක්වා වියදම්වල වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

(ඇ) පුර්ව වැය ඇස්තමේන්තු පිළියෙල කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී රු.31,000ක පරිපාලන වියදම් දරා තිබුණි.

5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර නිකුත්කරන ලද විගණන විමසුම් මගින් භාරකාර මණ්ඩලයේ සභාපතිවරයාගෙ අවධානයට යොමු කරන ලදී. පහත සදහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම් තැබීම
(ආ) ආයෝජනය
(ඇ) ආදායම් රැස් කිරීම
(ඈ) අයවැය ලේඛනමය පාලනය
(ඉ) බැංකු සැසඳුම් පිළියෙල කිරීම